# ජනාධිපති නීතිඥ "සුනිලුන්" ඇගැයුම



ශ්‍රී ලංකාවේ හිටපු නීතිපති සුනිල් ද සිල්වා මහතාගේ සේවය අගැයීමේ උත්සවයක් පසුගිය ඔක්තෝම්බර් 27 වෙනි ඉරිදා සිඩ්නි නුවර ඩොන් මුවර් ශාලාවේ දී පැවැත්විනි.

සුනිල් ද සිල්වා මහතා මුලින්ම අධිනීතිඥවරයෙකු ලෙස දිවිරුම් දී වසර පනහක් පිරීමේ අවසථාවයි ඒ. ශ්‍රී ලංකාවේ රජයේ නීතිඥවරයෙකු ලෙස දීඝී කාලයක් සේවය කර "ජනාධිපති නීතිඥ" විරුදාවලි ලැබූ ඔහු 1988 දී නීතිපති ලෙස දිවුරුම් දුන්නේය. ශ්‍රී ලංකාව වෙනුවෙන් විවිධ අන්තර් ජාතික සමුළුවල පෙනී සිටීමේ ගෞරවය ඔහුට හිමිවිය.

1992 දී ඕස්ට්‍රේලියාවේ පදිංචියට ආ සුනිල් ද සිල්වා මහතා අවුරුදු විස්සකට කිට්ටු කාලයක් නිව් සවුත් වේල්ස් රජයේ නීතිඥවරයෙකු ලෙස සේවය කර විශ්‍රාම ගත්තේය.

ශ්‍රී ලංකික සහ ඕස්ට්‍රේලියානු සම්භාවනීය පිරිසක් සහභාගි වුන උත්සවයේ දී ආරාධිත කථිකයන් වූ නිව් සවුත් වේල්සයේ රාජ්‍ය නීතිඥ මාක් ටෙඩෙෂ්කි සහ අධිනීතිඥ මෛත්‍රී පනාගොඩ සුනිල් ද සිල්වා මහතාගෙන් ශ්‍රී ලංකාවටත් මේ රටටත් සිදුවුනු අඛන්ඩ වටිනා සේවය විග්‍රහ කලහ.

මීට අමතරව වැඩ සටහන ඉදිරිපත් කල ආනන්ද අමරනාත්, ආචාර්ය පාලිත ගනේවත්ත, ශ්‍රී ලංකා සංගමයේ සභාපති ආචාර්ය ෂෙල්ටන් පීරිස්, නාට්‍ය ශිල්පී අර්නස්ට් මැකින්ටයර් සහ සනත් නානයක්කාර මහත්වරු සුනිල් ද සිල්වා මහතාගේ ජීවිතයේ විවිධ අංශයන් ගැන විස්තරාත්මක හා හාස්‍ය ජනක තොරතුරු ගෙනහැර පෑවෝය.
උත්සවයට සහභාගී වුන ඔහුගේ 96 හැවිරිදි මෑණියන් ද තම එකම පුතා ගැන වචන කිහිපයක් කථා කළාය.

දෙරටක නීති අංශයේ හිනි පෙත්තටම නැගි පුද්ගලයන් විරලය. ඒ දුර්ලභ ගණයට අයත් සුනිල් ද සිල්වා මහතාට අපි නීරෝගී විශ්‍රාම සුවය සහ දිඝායුෂ පතමු.

කල්දෙමුල්ල

නිර්මාණාත්මක ජායා රූ සටහන් තනූජා විජේසේකර


















සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com